# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 8 දරන
# රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1972 නොවැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1972 නොවැම්බර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 8 දරන රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1972 නොවැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 51/72.

**දෙපාර්තමේන්තු, විෂයයන් හා කාර්යයන් පැවරීම හා සම්බන්ධව 1970 ජූනි මස 2 වන දින අංක 14,908/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970 මැයි මස 31 වන දින දරන නිවේදනයෙහි රජයේ ඉඩම් විෂයයන් හා කාර්යයන් ඇතුළත්ව නොතිබීමේ හේතුවෙන් පැනනැගී ඇති ඇතැම් සැක දුරුකිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

අග්‍රාමාත්‍යවරයා විසින් අමාත්‍යවරයන්ට දෙපාර්තමේන්තු, විෂයයන් හා කාර්යයන් පැවරීම හා සම්බන්ධව 1970 ජූනි මස 2 වන දින අංක 14,908/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970 මැයි මස 31 වන දින දරන නිවේදනයෙහි ප්‍රමාද දෝෂයකින් සිදුවුණු අත්හැරීමක් නිසා, 1970 මැයි මස 31 වන දිනයෙන් ආරම්භවී 1971 ජූලි මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ රජයේ ඉඩම් හා සම්බන්ධ බලතල, යුතුකම් හා කාර්යයන් ක්‍රියාවේ යෙදවීමට කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයාට නීත්‍යනුකූල බලයක් තිබුණේද යන්න පිළිබඳව සැක පැනනැගී ඇති හෙයින් ද :

එමෙන්ම කෘෂිකර්ම හා ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් එකී කාලසීමාව තුළ අග්‍රාමාත්‍යවරයාගේ ගම්‍ය එකඟත්වය ඇතිව ද අනෙකුත් අමාත්‍යවරයන් බැහැර වන පරිදි ද රජයේ ඉඩම් හා සම්බන්ධිත කරුණු පිළිබඳ බලතල, යුතුකම් හා කාර්යයන් ක්‍රියාවේ යොදවා ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 8 දරන රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — කෙටි නාමය.

2. (1) රජයේ ඉඩම් හා සම්බන්ධිත විෂයයන් සහ කාර්යයන් 1970 මැයි මස 31 වන දිනයෙන් ආරම්භව 1971 ජූලි මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ අග්‍රාමාත්‍යවරයා විසින් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා වෙත පවරා තිබුණු ලෙස සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ; තවද ඒ අනුව රජයේ ඉඩම් විෂයයන් හා කාර්යයන් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා වෙත අග්‍රාමාත්‍යවරයා විසින් පවරා තිබුණේය යන පදනම මත කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා විසින් එකී කාලසීමාව තුල කරන ලද හෝ ඉටු කරන ලද සියලු ක්‍රියා 1970 මැයි මස 31 වන දින දරන ගැසට් නිවේදනයේ "කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා" යන උප ශීර්ෂය යටතේ එකී විෂයයන් සහ කාර්යයන් ඇතුළත්ව නොතිබුණ ද, වලංගු හා බලසහිත වේ. — රජයේ ඉඩම් විෂයයන් සහ කාර්යයන් 1970 මැයි 31 වන දිනයෙන් ආරම්භව 1971 ජූලි 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා වෙත පවරා තිබුණු ලෙස සැලකිය යුතු බව.

(2) මේ පනත ක්‍රියාත්මකවීමට පෙර පවරන ලද්දා වූ හෝ ආරම්භ කරන ලද්දා වූ ද අවසාන වශයෙන් විනිශ්චය කර නොමැත්තා වූ ද යම් නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී සහ මේ පනත ක්‍රියාත්මක

වීමෙන් පසුව පවරන ලද්දා වූ හෝ ආරම්භ කරන ලද්දා වූ යම් නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී, රජයේ ඉඩම් හා සම්බන්ධිත විෂයයන් හා කාර්යයන් පරිපාලනය කිරීම 1970 මැයි මස 31 වන දිනයෙන් ආරම්භව 1971 ජූලි මස 31 වන දිනයෙන් අවසාන වන කාලසීමාව තුළ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයාට පවරා තිබුණේ ද යන්න පිළිබඳ යම් ප්‍රශ්නයක් මතු වී ඇති හෝ මතු වන අවස්ථාවක ඒ ප්‍රශ්නය මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව සහ එම විධිවිධාන කෙරෙහි නිසි සැලකිලි ඇතිව නිශ්චය කළ යුතු ය.